YZA
LIBRARY
SRI LANKA.

තිත්මුවා
THITHMUWA

1985 ශ්‍රී ලංකා තරුණ සත්වවේදීන්ගේ සංගමය ගොඩනැඟීමේ වර්ෂය




කවරයේ කථාව

නැගෙනහිර අප්‍රිකාවේ සැවානා තණ බිම්වල වාසය කරන අලංකාර පෙනුමක් ඇති ''ඉම්පාලා'' පෙනුමින් මුවකුට සමාන වූ, ''ඇන්ටිලෝප'' නැමැති සත්ව විශේෂයට අයත් සාමාජිකයෙකි. දුඹුරු පැහැයෙන් යුත්, අධි කුනක් පමණ උසැති, ''ඉම්පාලා'' තරමක් කුඩා ඇන්ටිලෝපයෙකි. සිහින් ශරීරයක් හා දිගු පාද සහිත ඉතාම වේගවත් ධාවකයෙකි. පිරිමි සතාට පමණක් එක්තරා මෝස්තරයක අං යුවළක් ඇත. ශාඛ භක්ෂකයෙකු වන මෙම සත්වයාගේ ප්‍රධාන ආහාරය තණකොළ වේ. ඉතාම අහිංසක සත්ව කාණ්ඩයක් වන මොවුන් රංචු වශයෙන් ගැවසේ. සිංහයින්, දිවියන් හා අප්‍රිකානු වල් බල්ලන් වැනි සතුරන්ගෙන් ආරක්ෂාවීම සඳහා ''ඉම්පාලා'' ට ඇති එකම පිළිසරණ අශ්වයෙකු ට නොදෙවෙනි වූ වේගයකින් දිවීමට ඇති හැකියාවයි.

''ඉම්පාලා'' දෙහිවල ජාතික සත්වෝද්‍යානයේදී ජායාරූප ශිල්පී ගාමිණී කරවිදෙනියගේ කැමරා ඇසට හසු වූ අයුරු ''නිත්මුවා'' කවරයේ දිස්වේ.

''නිත්මුවා'' – ප්‍රකාශනය :– ශ්‍රී ලංකා තරුණ සත්වවේදීන්ගේ සංගමය

YZA
LIBRARY
SRI LANKA



ශ්‍රී ලංකා තරුණ සත්වවේදීන්ගේ සංගමය

(1972. 11. 17 දින නිටපු සත්වෝද්‍යාන අධ්‍යක්ෂ ලින් ද අල්විස් මහතා විසින් ජාතික සත්වෝද්‍යානයේදී පිහිටුවන ලදී.)

1985/86 නිළධාරී මණ්ඩලය

ගරු අනුශාසක :

බ්‍රැඩ්ලි ප්‍රනාන්දු මහතා

(ගරු අධ්‍යක්ෂ – සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව)

ගරු උප අනුශාසක :

ක්ලැරන්ස් පෙරේරා මහතා

(ගරු උප අධ්‍යක්ෂ–සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව)

CLASS No
ACC No: 0347

ගරු සභාපති :

ඒ. පෝල් ඊ. ආර්. මැනුවල් මහතා

ගරු ලේකම් :

එම්. ලලිත් ආර්. ද කොස්තා මහතා

ගරු භාණ්ඩාගාරික (වැ. බ.) :

එන්. සමන්මලී කුමාරසිංහ මෙනෙවිය

ගරු උප සභාපතිවරු :

ජගත් චතුරදේව ගුණවර්ධන මහතා (පොදු)
ඩී. කේ. රවීන්ද්‍ර චන්ද්‍රලාල් මහතා (අධ්‍යාපන)
වානක ජයන්ත පෙරේරා මහතා (මහජන සම්:)
ප්‍රසාද් සිරිවර්ධන මහතා (ප්‍රකාශන)
චම්පිකා ද සිල්වා මෙනෙවිය (නියෝජිත)

ගරු උප ලේකම්වරු :

රත්නා අමරසිංහ මෙනෙවිය (පොදු)
නිරූපා විජේසිංහ මෙනෙවිය (අධ්‍යාපන)
සන්ධ්‍යා විජයන්ති මෙනෙවිය (මහජන සම්:)
රිජිතා ඉදුරුව මෙනෙවිය (ප්‍රකාශන)
නිලංග කුරුප්පුආරච්චි මහතා (නියෝජිත)

ගරු උප භාණ්ඩාගාරික :
මනහර විජේවික්‍රම මහතා

ගරු සභිකවරු :
ප්‍රසන්න චාන්දන ජයසේකර මහතා
සුසිල් පෙරේරා මහතා
ටෝනි සීනෝ මහතා
ජයන්ත විජේසූරිය මහතා
දිනේෂ් රංජන ජයතුංග මහතා

ගරු නිටපු සභාපති : හියසින් මොල්ලිගොඩ මහතා

With Best Compliments

from

F. N. TRADERS

IMPORTERS OF ELECTRICAL GOODS
HARDWARE ITEMS & GENERAL MERCHANDISE

J. M. FUARD NAJEEB
Proprietor

42/42, Stewart Street,
Colombo-2
Sri Lanka

With Best Compliments

from

JAYES TRADING COMPANY

111 - BANKSHALL STREET
P. O. BOX 293
COLOMBO.

Tel : 56366 - 28694 - 549514

ගරු සභාපති තුමන්ගෙන්

නපුරු යැයි සමහරුන් කියනා ''දහතුන් විය'' පසුකළ අප සංගමයේ, සම්මානනීය ජගත් තරුණ වසරේ ඔබේ සේවකයා ලෙස, වසර හතකට පසුව එළි දකින සංගමයේ වාර්ෂික ප්‍රකාශනය වෙනුවෙන් ආනන්දනීය හැඟුමෙන් යුතුව මම මෙසේ ලියමි.

සංගමය තුල 1985 වසරේදී පැහැදිලි වූන්, යහපත් වූන් ගොඩනැංවීමක් ඇතිකිරීම සඳහා අප ගත් මග නිවැරදි බව සනාථ කළ සියළුම සොයුරු සොයුරියන් හට සංරක්ෂණයේ ප්‍රණාමය හිමි විය යුතුය.

ශ්‍රී ලංකාවේ පරිසර ප්‍රශ්න ඇතිනාක් කල් එම අභියෝග වලට එරෙහිව පරිසරයට සාමය ළඟා කරවීම සඳහා සකල අංග වලින් යුතුව ක්‍රියාත්මක වන ප්‍රබල ස්වේච්ඡා සංවිධානයක් ලෙස ශ්‍රී ලංකා තරුණ සත්වවේදීන්ගේ සංගමය තව තවත් පිරිපුන් විය යුතුව ඇත.

සංරක්ෂණයේ අවැසි බව හඳුනා ගත් කැපවීමකින් යුතු තුරුණු පිරිසක් තුළින් ගොඩනැගෙන අසීමිත බලය පා, හෙට දිනදී යළි නොඩනැගිය නොහැකි ලෙස විනාශ වීමට පෙර, වන සතුනටද අපට මෙන්ම පරිසරය තුළ නිදහස්ව ජීවත්වීමට අයිතියක් ඇති බැවින්, අනෙකුත් සියළුම ස්වේච්ඡා සංවිධාන හා අත්වැල් බැඳගනිමින් මෙම සම්භාවනීය අරමුණ ඉටු කර ගැනීම සඳහා වහා එකමුතු විය යුතුව ඇත.

අප බොහෝදෙනා දකින එම සිහිනය හෙට දිනදී සැබෑ වේවා'යි ඉන සිතින් පතමි.

ඒ. පෝල් ර. ආර්. මැනුවල්

ගරු ලේකම් තුමන්ගෙන්

සංරක්ෂණය වූ කලී ඉතා වෙහෙසකර වූන්, ඉතා විශාල කැපකිරීමකින් යුක්තව යා යුතු වූන් ගමන් මගක් සහිත වූ ඉලක්කයකි. එතරම් වූ වෙහෙසීමක් සත්‍ය වශයෙන්ම දරාගැනීමේ ශක්තිය වැඩියෙන්ම ඇත්තේ පනස්විය ඉක්මවූ ජීවිතයේ අගභාගයේ සිටින මහල්ලන් වෙත හෝ නොදරු ළදරුවන් වෙත හෝ නොව ජීවිත සටන ආරම්භයේ සිටින තරුණ තරුණියන්ටම බව කිසිවකුටත් අමුතුවෙන් කිවයුත්තක් නොවේ.

ශ්‍රී ලංකාවේ තරුණ සත්වවේදීන්ගේ සංගමය එවන් තරුණ තරුණියන් රාශියකගේ පහස ලබන හා ශක්තිය කැටිකොටගත්තකි. එහෙයින් එම කර්තව්‍යයේ මූලිකත්වය සංගමයට හිමිවන්නේ නිරන්තරයෙනි. සංරක්ෂණය කරා යන ගමන ඕනෑම අයකුට යාහැක්කක් වුවද මනා දැනුම, අවබෝධය මේ ගමන සඳහා උචිත හා පහසු කරවන්නක් ලෙස දැක්විය හැක.

අප සංගමය එවැන්නන්ගේ එකතුවක් යයි අපට ආඩම්බරයෙන් කිව හැක. කෙසේ වුවද සංගමය අතීතයේ ලැබූ අත්දැකීම් තුලින් පන්නරය ලබා වර්තමානයේ ඉමහත් සේවාවක් සංරක්ෂණය වෙනුවෙන් කරන්නට සමත්ව සිටී. එය අනාගත දීප්තිමත් භාවයේ සංකේතයයි.

එම්. ලලිත් ආර්. ද කොස්තා

වසරක පිය සටහන්

එකදස් නවසිය අසූපහ ශ්‍රී ලංකා තරුණ සත්වවේදීන්ගේ සංගමයට දහතුන්වන විය සපිරුණු වසරයි. සිරිලක තුල ඇති ස්වාභාවික සම්පත් අතර මුතු, මැණික් වලටත් වඩා චමත්කාර වනසත්ව ජීවිත හා වනාන්තර ඇතුලු පරිසරය ආරක්ෂාකර ගැනීම සඳහා තරුණ සහයේ වැදගත්කම හා අවශ්‍යතාව මන ගොඩනංවනු ලැබූ ශ්‍රී ලංකා තරුණ සත්වවේදීන්ගේ සංගමය ගතකල වසර දොලහ තුලදී නොලත් අත්දැකීම් සමුදයකට මේ වසර තුලදී මුහුණ දුන්නාය.

ජාතික සත්ව උද්‍යානය, සංගමය ආරම්භ කරණු ලැබූ ස්ථානයයි. එය මෙතෙක් අප‍ගේ කටයුතු නාභිගත කල, අප කටයුතු පවත්වාගෙන ආ, සංගමයේ ශාඛා බිහි වූ පසු මූලස්ථානය ලෙස හඳුන්වනු ලබන ස්ථානයයි. මේ නිසා මෙම ස්ථානය තුල සිදුවන බොහෝ දේ හා සිදුකරණු ලබන බොහෝ දේ සංගමයට තදින් දනේ. එය සත්වෝද්‍යානය මවත් සංගමය දරුවන් ලෙස සැලකුවහොත්, මවක හා ගැබෙහි සිටින දරුවන් අතර ඇති සම්බන්ධය නිදසුනක් ලෙස ගෙන ඉතා පැහැදිලිව ප්‍රකාශකල හැක.

''1985'' මෙතකදී සත්ව උද්‍යානයේ විශාලම පෙරළි ඇතිවූ වසර ලෙස හැඳින්වුවහොත් එය නිවැරදිය. සත්ව උද්‍යානයේ ගරු අධ්‍යක්ෂ ලෙස කටයුතු කල ලින් ද අල්විස් මැතිතුමා සිය, වසර තිස් දෙකක සේවා කාලය අවසන් කොට විශ්‍රාම ගැනීම එම පෙරළියේ ඉදිරියේ නිබුණු කරුණු දෙකින් එකක් වන අතර අනෙක නම් සත්ව උද්‍යානයේ සහකාර අධ්‍යක්ෂ (පොදු) වශයෙන් කටයුතු කල බුඩලි ප්‍රනාන්දු මහතා නව අධ්‍යක්ෂ වරයා ලෙස පත්වීම දැක්විය හැක. මෙම පෙරළිය සංගමයේ පැවැත්ම හා ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය මූලික සාධක අතර මුල් වන අනුශාසක ධුරය තුලද වෙනස්කම් ඇති කැරවීය. මෙමගින් සංගමයට නව අනුශාසක වරයකු ලැබුණු අතර එක්වසරක් තුලදී ප්‍රථම වරට අනුශාසකවරුන් දෙපොලකගේ පහස ලැබීමට සංගමයට අවස්ථාවක් උදාවීය. මෙම වෙනස ඇතිවීමට පෙර සංගමයේ කටයුතු සාර්ථක ලෙස පවත්වා ගෙන යාමට අනුපමේය සේවයක් කල දෙපාර්තමේන්තුවේ ගරු සහකාර අධ්‍යක්ෂ (මත්ස්‍යාගාර) චන්දිම ද අල්විස් මහතා හා ගරු සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) ටී. සිවසම්බු මහතා දැරූ සංගමයේ උප අනුශාසක ධුර නිස්විය.

ජාතයන්තර අවධානය යොමුවූ 1985 ජගත් තරුණ වසරේදී සිදුවූ මෙම වෙනස්කම් ඇතුලු තවත් විෂමතා මධ්‍යයේ නොසැලී අප නව රටාවක් ඔස්සේ සංගමයේ වැඩ සටහන් දියත් කල අතර ඔබේ මනකයේ රැඳෙනු පිණිස වසරක පිය සටහන් මෙසේ කැටි කරමු.

- සංගමය කොළඹ අවට සමාජික සමාජිකාවන් සඳහා පවත්වනු ලබන සාමාන්‍ය සති අන්ත වැඩ සටහන් '' පරිසරයේ සාමය සඳහා තරුණ සහභාගිත්වය තුලින් සංවර්ධනය '' යන තේමාව ඔස්සේ ක්‍රියාත්මක කරණු ලැබූ අතර න්‍යායික කරුණු අඩංගු පොදු දේශන, ප්‍රයෝගික ව්‍යාජ්නි සූහුණු කිරීමේ දේශන 15 ක්ද, ජල ජීවී, පක්ෂී, උරග, ක්ෂීරපායී හා කෘමී යන අංශ ආශ්‍රිතව සාකච්ඡාවාර 25, චිත්‍රපට දර්ශන හා ක්ෂේත්‍රචාරිකා, 7 ක්ද පවත්වා ඇත. මෙම වැඩ සටහන් සඳහා සාර්ථක ලෙස සහභාගි වූ අය උදෙසා ඒ ඒ ක්ෂේත්‍ර ආශ්‍රිතව සත්ව උද්‍යාණ ගරු අධ්‍යක්ෂවරයාගේ අධික්ෂණය යටතේ පරීක්ෂණයක් පවත්වා සහතික පත් නිකුත් කරණු ලැබීම මතින් අප අධ්‍යාපනික වැඩ සටහන් සඳහා සහභාගි වූවන් දිරිගන්වනු ලැබීය.
- සංගමය මගින් ප්‍රථම වරට සංවිධානය කරණු ලැබූ අභයභූමි චාරිකාව උඩවලව අභය භූමියේ ජූනි 28, 29, 30 යන දිනවල සමාජික සාමාජිකාවන් 35 දෙනකුගේ සහභාගිත්වය යෙන් සිදුවිය. මේ තුලින් ස්වාභාවික පරිසරය හා වන සතුන් නිරීක්ෂණයක සාර්ථක ලෙස යෙදීමට අපට හැකිවිය.
- කලක සිට සංගමය උත්සුක වූ අත්තිඩිය වෙල්යාය සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා සහය ලබාගැනීම හා ප්‍රචාරයක් ලබාදීමේ අදහස සඳහා එම ප්‍රදේශයේ තොරතුරු අඩංගු වාර්තාවක් ගරු තරුණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වරින රත්වත්ත මැතිතුමා වෙත භාරදීමට හැකිවීම ඉදිරි දිනක රාජ්‍ය අමාත්‍යාංශය වෙතින්ද සහය ලබාගැනීමට රුකුලක් වනු ඇත.

- පාසැල් වල පිහිටුවා ඇති සත්ව සංරක්ෂණ සංගම් දිරිමත් කරවීම සඳහාත් දේශීය පැලෑටි වල වටිනාකම හඳුන්වාදීම සඳහාත් අප දියත් කල ඔසු උයන් ව්‍යාපෘතිමේ වැඩ සටහනේ ප්‍රථම පියවර කොළඹ අනුලා විද්‍යාලයීය භූමියේ සාර්ථක ලෙස ක්‍රියාත්මක කැරවීමට අපට හැකි වූ අතර අද එම ව්‍යාපෘතිය විද්‍යාලීය සිසුවියන් විසින් පවත්වා ගෙන යනු ලබයි.
- සංගමයේ තවත් වාර්ෂික වැඩ සටහන් වසර කීපයකට පසුව අප පැටැන්වූවෙමු. එය අ. පෙ. ස. (උ/පෙ) විද්‍යා සිසුන් සඳහා පවත්වනු ලබන විද්‍යා සම්මන්ත්‍රණයයි. මෙය නුගේගොඩ සාන්ත මරියා හා සාන්ත යොහාන්තුමාගේ තරුණ සංගමයේ අනුග්‍රහය ඇතිව එම ප්‍රජා ශාලාවේදී පවත්වනු ලැබීය. මෙම සම්මන්ත්‍රණය සඳහා මහාචාර්‍ය කාලෝ පොන්සේකා, නිමල් ප්‍රනාන්දු, ජීන්ත්‍රේන්ද්‍ර පතිනායක, එච්. ආර්. නෝනිස්, මහින්ද බන්ඩාරනායක යන මහත්වරුන් විසින් දේශණ පවත්වනු ලැබීය.
- ශ්‍රී ලංකාවේ පරිසර ප්‍රශ්න පිළිබඳව ජනතා අවධානය යොමු කැරවීම සඳහා සංගමය මගින් ප්‍රථම වරට '' සංරක්ෂණ '' නම් පුවත්පත අගෝස්තු මාසයේදී මුද්‍රණය කළ අතර මෙයින් පිටපත් 1500 නිකුත් කෙරිණි. මේ තුලින් සංගමයට පුලුල් ප්‍රචාරයක් ලැබුණු අතර මෙය පවත්වා ගෙන යාමෙන් සංගමයට මාසික ආදායමක් ලබා ගත හැකි බව පැහැදිලිවී ඇත. මේ සඳහා අනුග්‍රහය ලබා දුන්නේ සංගමයේ සමාජිකාවක් වන කමණි අක්මීමන සොහොයුරිය හා අක්මීමන මැතිණිය විසිනි.
- අප විසින් මේ වසරේදී පාසැල් කීපයකම නව පාසැල් සත්ව සංරක්ෂණ සංගම් ඇතිකල අතර ක්‍රියාකාරී පාසැල් සංගම් අතර ඉදිරියෙන් සිටින වෙස්ලි විද්‍යාලීය සිසුන් හැටදෙනෙකු සමග අගෝස්තු මස 5 ද උඩවත්ත කැලයේ කල නිරීක්ෂණ චාරිකාවද සංගමය විසින් ප්‍රථම වරට මෙහෙයවූ වැඩ සටහන් අතරට එක්වේ. මෙම විද්‍යාලීය සංගමයේ සිසුන් විසින් සිය සංවත්සරය සමරා කළ එක් දින වැඩ මුලුවද රමණීය එකක් විය.
- සංගමයේ වාර්ෂික අධ්‍යනික දිනය යෙදුනු සැප්: 22 ද විශේෂ මුහුණුවරකින් පැවැත්වීම තවත් මිතුරන් රාශියක් සංගමයට ඇතිකැරවීමට සමත්විය. මෙය අධ්‍යාපන මිත්‍රත්ව දිනයක් ලෙස කැස්බ්වැව යෞවන සමාජ ප්‍රාදේශික බලමණ්ඩලයේ විශේෂ සම්බන්ධීකරණයක් ඇතිව තරුණ තරුණියන් 500 දෙනකුගේ සහභාගිත්වය ඇතිව වනසත්ව ජීවිත පිළිබඳ අධ්‍යයන වාර, සාකච්ඡා හා විනෝද ක්‍රීඩා සහිතව අවසන් විය. සත්ව උද්‍යාන ගරු අධ්‍යක්ෂතුමා හා ජාතික තරුණ සේවා සභාවේ උප අධ්‍යක්ෂක කුමාරගේ මහතා ඇතුළු ප්‍රභූවරුන් පිරිසක් සහභාගි වූ මෙම වැඩ සටහනට ජාතික තරුණ ක්‍රිස්තියානි සංගම් සභාවේ විශේෂ සහභාගිත්වයක් දැක්වීනි.
- අප ලැබූ තවත් ජයග්‍රහණයක් ලෙස වසර මුලදී ඇති කරණු ලැබූ කුඩා පරිමාණයේ පුස්තකාලය දැක්විය හැක. පරිත්‍යාග කරණු ලැබූ පොත් පත් හා අපේම සටහන් ඇතුලත් කරනු ලැබූ මෙම පොත් එකතුව සංගමයේ සමාජිකයන්ගේ ආනන්දයට හේතු වූ අතර මෙය වැඩි දියුණුකර ගැනීම තුලින් ඉදිරි දිනක දැනුම සොයන දැනුම බෙදන අපේ සංගමයට විශාල අත්වැලක් සදනු ඇත.
- පාසැල් සත්ව සංරක්ෂණ සංගම් අතර සම්බන්ධතා තහවුරු කිරීම සඳහා වසර භතරකට පසුව පවත්වන ලද නියෝජන කමිටු සම්මේලනය ද තවත් සාර්ථක වැඩ සටහනක් විය. මෙයට පාසැල් 22 ක නියෝජිතයින් 45 දෙනෙකු සහභාගි වූ අතර මෙම වැඩ මුලුව '' පරිසර සංරක්ෂණය සඳහා අපගේ කාර්ය භාරය '' යන තේමාව යටතේ පැවැත්විණි.
- '' වනදිවියයි – යොවුන් අපියි '' පෝස්ටර් නිර්මාන තරගය අප දියත් කල යෝධ ව්‍යාපෘතියක් විය. අප මතකයේ නියුණු ලෙස සටහන් වූ මෙම වැඩ සටහන සඳහා තරඟ කරුවෝ විවෘත, පාසැල් කනිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ ලෙස නිර්මාන 1300 පමණ අප වෙත ඉදිරිපත් කර තිබුණි. මෙම තරඟය විනිශ්චය කළේ සත්වඋද්‍යාන අධ්‍යක්ෂ බ්‍රැඩ්ලි ප්‍රනාන්දු, ලංකා සංචාරක මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ රෙන්ටන් ද අල්විස් හා සුප්‍රකට කාටුන් ශිල්පී විජේසෝම යන මහත්වරුන්ය. මෙහි අවසාන අදියරය වූ නිර්මාන ප්‍රදර්ශණය හා ත්‍යාග ප්‍රධාන උත්සවය 1985 නොවැම්බර් 11 දින ජෝන් ද සිල්වා සමරු රඟහලේදී හා කලාභවනේ දී සිදුකරණු ලැබීය.

(9 වන පිටුවට.....)

With Best Compliments

from

THAKSALA TRADING CO.

PAPER MERCHANTS & PAPER CUTTING

Office :-
881/12, Shopping Arcade
1st Cross Street
Colombo-11
Tel :- 32851

Factory :-
93/45, Modara Street
Colombo-15
Tel :- 522100

With Best Compliments


from

AHAMED IMPEX

90, 1-A FIRST LANE,
PRINCE STREET,

COLOMBO-11

සාමාජික දිනය ....



වමේ සිට අසුන් ගෙන :-

භාණ්ඩාගාරික (වැ. බ.) – එන්. යටන්ගලි කුමාරසිංහ මෙනෙවිය
උප සභාපති (අධ්‍යාපන) – සී. කේ. ආර් චන්ද්‍රලාල් මහතා
ප්‍රධාන ලේකම් – ලලින් ආර්. ද කොස්තා මහතා
යන්ත්‍ර උද්‍යානයේ හිටපු ප්‍රධාන ලිපිකරු – කුමාර අනංග මහතා
යන්ත්‍ර උද්‍යාන අධ්‍යක්ෂක – එස්. බී. ඒ. ප්‍රනාන්දු මහතා
යන්ත්‍ර උද්‍යාන හිටපු අධ්‍යක්ෂක – ලීන් ද අල්විස් මහතා
යන්ත්‍ර උද්‍යාන පශු වෛද්‍ය – ජයන්ති අලහකෝන් මහත්මිය
සභාපති – පෝල් මැතුවල් මහතා
පොදු උප සභාපති – ජගත් ගුණවර්ධන මහතා
පොදු උප ලේකම් – රත්නා අමරසිංහ මෙනෙවිය

ඇතුළ සාමාජික සාමාජිකාවන්

YZA
LIBRARY
SRI LANKA.

මෙහි ප්‍රධාන ආරාධිතයා වූයේ තරුණ සේවා ගරු අධ්‍යක්ෂ ජනරාල් චරිත රත්වත්ත මැතිතුමාය. මෙම උත්සවය සඳහා නියෝජ්‍ය පොලිස්පති නීල් විරසිංහ හා එම මැතිණියද, සහභාගි වූහ. 11, 12, 13 යන තෙදිනම පැවැත්වූ සංරක්ෂණ මාර්ග දේශනද ඇතුලත් වූ මෙම ප්‍රදර්ශනය පාසැල් සිසුන් ඇතුලු 2000 ක් පමණ දෙනාගේ නැරඹීමට ලක්වූ අතර තරහය සඳහා සහභාගි වූ සියලුම දෙනා දිරි ගැන්වීම් වස් සහතික පත් නිකුත් කර ඇත.

- සංගමයේ නිර්මාතෘ ලීන් ද අල්විස් මහතා කල සේවය සැමරීම් වස් ලීන් ද අල්විස් අභියෝගතා කුසලානය සඳහා රචනා තරහයක් පැවැත්වීමට තීරණය කලෙන් එහි ප්‍රථම තරහය ''වනදිවි සුරැකුමට අපි ආවෙමු පෙරට'' යන මාතෘකාව යටතේ අප සමාජික සමාජිකාවන් අතර පවත්වන ලදි.
- වාර්ෂික සාමාජික දිනය මෙවරද ඉතා උත්කර්ෂවත් ලෙස නොවැ. 11දින දවස පුරා පැවැත්විය. මෙය ඉතා වැදගත් කමකින් යුතු එකක් ද වූවේ සත්ව උද්‍යානයේ ගිටපු ගරු අධ්‍යක්ෂතුමා හා නව අධ්‍යක්ෂතුමා යන දෙදෙනාම සහභාගි වූ සමාජික දිනය වීම නිසාය. මෙහි ප්‍රධාන ආරාධිතයා වූවේ සංගමයේ ගරු නිර්මාතෘ ලීන් ද අල්විස් මැතිතුමාය. ආරම්භක උත්සවයෙන් පසු සියලුම දෙනා සමරු ඡායාරූපයකට පෙනී සිටියහ. සමාජික දින ලොතරැයි දිනුම් ඇදීමද මෙදින සිදුවිය.
- සංගමයේ වාර්ෂික චාරිකාව මෙවර ජනවාරි 5 දිනට යොදගෙන නිබුණු අතර මෙය තරුණ සේවා අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ කාරුණික අනුග්‍රහය ඇතිව යොවුන් සිත්තුල අමරණීය සිහිවටන ඇති කරණු ලබන බෙල්වුඩ් රූපවාහිනී ගම්මානය ආශ්‍රිතව සිදුකරණු ලැබීය. මෙහිදී පැල සිටවීමේ වැඩ සටහනක් හා විශේෂ සංගීත සංදර්ශනයක් අප වෙනුවෙන් පවත්වනු ලැබිය. මෙයට සමාජික සමාජිකාවන් 80 ක් පමණ සහභාගී වූහ.
- සංගමයේ ප්‍රථම වරට ත්‍යාග ප්‍රධානෝත්සවයක් පැවැත්වූ වසරවූ මෙම වසරේ වාර්ෂිකව හොඳම සමාජිකයා හා සමාජිකාව තේරීමද ඒ තුලින් සංගමයේ කටයුතු සඳහා සහභාගිවන්නන් උනන්දු කැරවීමද අපේක්ෂා කරණු ලැබූ අතර මෙය ප්‍රායෝගිකවද සාර්ථක විය. පළමුවන ත්‍යාග ප්‍රධාන උත්සවය පෙබරවාරි 2 ද පවත්වනු ලැබූ අතර අධ්‍යයන කමිටු පරීක්ෂණයේ සහතික පත්, නියෝජ්‍ය කමිටු සම්මේලනයේ සහතික පත්, ලීන් ද අල්විස් කුසලාන සඳහා පැවැත්වූ තරහය සඳහා ත්‍යාග හා සහතික පත් ප්‍රධානයද මෙහිදී සත්වඋද්‍යාණ අධ්‍යක්ෂ බැඩ්ලි ප්‍රනාන්දු මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුවිය.
- සංගමය ප්‍රථම වරට සිය නියෝජිතයින් දිපව්‍යාප්ත වැඩසටහන් සඳහා නියෝජනය කැරවීමට සැලැස්වූවාය. තරුණ ක්‍රිස්තියානි සංගම් සභාව මෙහෙයවූ නායකත්ව පුහුණු කඳවුර මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් නිවාරණ තරුණ ශික්ෂකයින් පුහුණු කඳවුර, ජාතික තරුණ කඳවුර, ශ්‍රී ලංකා පදනම් ආයතනය මෙහෙය වූ පරිසර සංරක්ෂණය පිළිබඳ වැඩ මුලුව, පරිසර පර්ෂදය මෙහෙයවූ සම්මන්ත්‍රණය ඉහත් සමහරකි. මේ හැරුණ විට 1986 වසරේ යොවුන් පුරය - මානලේ සඳහාද සංගමය සිය නියෝජිතයින් 14 දෙනකු සහභාගි කැරවීමට කටයුතු කළහ.

''තිත්මුවා'' සංගමයේ වාර්ෂික අධ්‍යාපනික ප්‍රකාශණයයි. වසර හයකට පසුව එලිදකින මෙම 1985 ''නින් මුවා'' කලාපයද අප කල නවත් එක ව්‍යාපෘතියක් ලෙස ගැදින්විය හැක.

ජාත්‍යන්තර එඩින්බරෝ යෞවන නිදහස් වැඩ සටහන සඳහා අප සංගමය අනුබද්ධ වී සිටී. මෙමඟින් හෙට දින ජාත්‍යන්තර වැඩ මුලු වලටද සංගමය සහභාගි වනු ඇත. අපි මධ්‍යම පරිසර අධිකාරිය, පරිසරපර්ෂදය, ජගත් තරුණ වර්ෂ කාර්යාලය ආදී ආයතන සමග මේ වසර තුලදී නොබිඳෙනසේ අත්වැල් බැඳ ගතිමු. වනසත්ව හා ස්වභාව ආරක්ෂක සංගමය මහනුවර යොවුන් ගවේශන සංගමය, සංරක්ෂණයට පා නගමු, සෞඛ්‍යදන ව්‍යාපාරය වැනි ස්වේච්ඡා සංවිධාන අප හා එක්ව කටයුතු කිරීම අමතක කල නොහැකිය. ගුවන් විදුලි වැඩ සටහන් සාකච්ඡා වට තුලින් අප ජනතා සවනට ලංවිමු, පුවත් පත් වලින්, ලිපි වලින්, ප්‍රදර්ශණ තුලින් ජනතා සවනට පමනක් නොව මනසටද ලංවිමු. සංරක්ෂණ අවශ්‍යතා ඇති අවස්ථා කීපයක් හඬ නහා ඒ බව කීවෙමු. යමක් කරණට හැකි වූ අවස්ථාද ඇති කරගත්තෙමු.

- යෞවන කටයුතු ඩිළිබඳව ශ්‍රී ලංකාවේ සුවිශේෂ ස්ථානයක් ගන්නා රාජ්‍ය ආයතන පවා සභය කරගැනීමට තරම් වූවෙමු. සිරිලකෙහි වනදිවි සුරකු ම පෙරමුණු කරගත් ආයතන පවා යොමුකරවන රාජ්‍ය අමාත්‍යාංශය පවා අප කටයුතු අනුමත කරණ මට්ටමකට සංගමය ගෙන ගියෙමු. ස්වයං අවබෝධයෙන් ලිවීමට, කියවීමට හා අපගේ අරමුණ ඔස්සේ කථා කිරීමට හැකි පිරිසක් බිහිකෙලෙමු.

සංගමයේ පසුගිය වසරකිපය දෙස බලා ''සංගමය ගොඩනැගීමේ වසර'' ලෙස හඳුන්වා ජගත් තරුණ වසරේ අප ගිය මග සංගමය පවතිනු දකුම අගය කරණ සියලු දෙනා විසින් ප්‍රණාමයෙන් යුතුව ස්මරණය කරණු ඇතැයි විශ්වාස කරමු.

හීලෑ කළ ආසියාතික අලින් බෝකිරීම

ශ්‍රී ලංකා ජාතික සත්ව උද්‍යානයේ අධ්‍යක්ෂ
එස්. බී. යූ. ප්‍රනාන්දු මහතා විසිනි

තම වාසස්ථාන වැනසීයාම නිසා ආසියාතික අලියා වර්තමානයේදී විනාශවී යාමට ඉතා ආසන්න තත්ත්වයකට පත්වී තිබේ. අද මේ වර්ගයේ අලින් ශ්‍රී ලංකාව, ඉන්දියාවේ සමහර ප්‍රදේශවල, භූතානය, බංගලි දේශය, නේපාලය, බුරුමය, තායිලන්තය, මලයාසියාව, ඉන්දුනීසියාව, සුමාත්‍රා හා බෝර්නියෝ දූපත්, වියට්නාමය, කම්පුචියාව, චීනයේ සමහර ප්‍රදේශවල, සහ ලාඕසයේ ජීවත් වේ. ශ්‍රී ලංකාවේ වියලි කලාපය සහ ඉන්දු චීනයේ කඳුකරය වැනි මිනිස් වාසස්ථාන වලට එතරම් යෝග්‍ය නොවන ප්‍රදේශ වලට මේ රටවල සිටින අලින්ද බොහෝ දුරට සීමාවී ඇත. එක් කාලසීමාවකදී අලියාගේ ව්‍යාප්තිය ඇත පෙරදිග සිට මැද පෙරදිග තෙක් විහිදී තිබුනි. මැද පෙරදිග යුප්‍රටිස් හා ටයිග්‍රිස් ගංගා නිම්නයන්හි එම සතුන් ක්‍රි. පූ. 5 වන සියවසෙහි දී විනාශයට පත්විය. ක්‍රි. ව. 10 වන සියවස තෙක් ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ මුළුමහත් දකුණු චීනයේ පැතිරී සිටියද, ජනගහනය වැඩිවීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා භූමිය එළිකිරීම සමග අලි ව්‍යාප්තිය අන්තරාදයක ලෙස අඩුවෙමින් පවතී. අද ආසියාතික අලින්ගේ මුළු සංඛ්‍යාව 25,000 පමණ වේ. ''අන්දමන්'' දිවයින්හි සිටින 30 පමණ ඇතුලත්ව ඉන්දියාව, බංගාලි දේශය හා භූතානය යන රටවල 10,000 පමණද, ශ්‍රී ලංකාවේ 2500 සිට 3000 අතර සංඛ්‍යාවක්ද, බෝර්නියෝ හි 2000 පමණද, බුරුමයේ 5000 පමණද සිටී. චීනයේ ''යුනාන්'' ප්‍රාන්තයට සීමාවී අලි 100 පමණ සහ කම්පුචියාව, ලාඕස්, වියට්නාම් යන ඉන්දුචීන රටවල 3500 සහ මලයාසියාවේ 500 පමණ ඇත. සුමාත්‍රාව තුල 3000 ද, තායිලන්තය තුල 2500 පමණ හා නේපාලයේ 150 පමණද වාසය කරති.

අලින්ට පුළුල් වාසස්ථාන පරාසයකට අනුවර්තනය විය හැක. අතීතයේ තෙත් කලාපයේ පහතරට මෙන්ම උඩරටද, වාසය කල විශාල අලි ජනගහනය මීට හොඳ නිදසුනකි. හොඳ ජල සැපයුමක් සහිත ප්‍රදේශයනට අලින් වඩාත් ප්‍රියකරයි. ඉංග්‍රීසීන්ය පාලනය සමයෙහිදී තෙත් කලාපයේ ප්‍රදේශ තේ රබර් හා පොල් වගාවන්ට යොදු ගැනීම සමග අලින්ට ශුෂ්ක, වියලි කලාපය කරා පසුබැමට සිදුවිය. වියලි කලාපයේ තිබෙන පරිසර තත්වයට ඔවුන් අනුවර්තනය වූ අතර, ඔවුන් අද දක්වාම එහි රැඳී සිටින්. එනමුත් වර්තමානයේදී එම ප්‍රදේශවල ද භූමිය මනුෂ්‍ය කටයුතු වලට යොදුගැනීම සමගම ඔවුනට එහිද වැඩි කාලයක් ජීවත්වීමට නොහැකි වන තත්ත්වයක් උදාවී ඇත. මේ අවස්ථාවට අද අලින් වාසය කරන අනෙකුත් ආසියාතික රටවල්ද මුහුණපා ඇත. වල් අලි පරපුර රැක ගැනීමට උනන්දු වන රජයයන් විසින් මේ වන විට සංරක්ෂණ ක්‍රියාමාර්ග වලට එලඹී ඇත. මංකඩ වලින් සම්බන්ධව තිබෙන අභයභූමි ඇති කිරීම මගින සෘතු වෙනස්වීම හා ආහාර ලැබීමේ අවස්ථාව මත ඔවුන්ට ප්‍රදේශවලින් ප්‍රදේශවලට සංක්‍රමණයවීමේ හැකියාව ලැබී ඇත. එනමුත් මේ බිම්වල නඩත්තු කල හැකි සංඛ්‍යාව සීමා වනවා පමණක් නොව දිනෙන් දින වැඩිවන ජනගහනය එම ප්‍රදේශද අත්පත්කර ගැනීමට පටන් ගෙන තිබේ. ආසියානු අලියාගේ අනාගත සංරක්ෂණය තහවුරු කරලීම සඳහා විශාල වශයෙන් අලින් අල්වා බෝකරවීමට වැඩ පිලිවෙල් සැකසිය යුතුව ඇත.

අලින් අල්වා බෝකිරීම දැන් ඇමරිකාවේ සහ යුරෝපයේ සත්වෝද්‍යාන වල සිදු කරන අතර එය තායිලන්තය ඉන්දියාව බුරුමය යන රටවල වසර 50 කට වැඩි කලක් තිස්සේ සිදුකර ඇත. බුරුමයේ කොටන් ඇදීමට යොදගන්නා ගැහැණු සතුන් (ඇතින්නියන්) උදේ වරුවේ

වැඩට යොදාගෙන සවස් කාලයේදී වල් අලින් හා ප්‍රජනනය සිදුවීම සඳහා වනාන්තරයට මුදාහරී. මෙම ක්‍රමය ඉන්දියාවේ ඇසැමයේ හා දකුණේ ප්‍රදේශවල සිදුකෙරේ. මෙවැන් ක්‍රමයක් ශ්‍රී ලංකාවේ අභයගුවී වලටද යෝග්‍ය වේ. ඒ සඳහා තෝරන කැලෑගැනි අභය භූමි ප්‍රමාණවත් වැඩිමයෙන් අප සතුව පවතී. ආරම්භයක් සඳහා ඇතින්නියන් 10-15 සහ උඩුවලවේ වැනි අභය භූමියක් යොදාගත හැක. සෑම ඇතින්නෙකුටම ඇත්ගොවිවෙකුද, දවසින් වැඩි වේලාවක් වනගතව සිටින නිසා යලි සොයා ගැනීමට ක්‍රමයක්ද, අවශ්‍ය වේ. ගුරුවයේ කම් විශේෂිත ශබ්දයක් නිතුන් කරන ඔහුවක් බෙල්ලේ බැඳීමෙන් ඇත්ගොවිවරුට සෑම සහා සොයා ගැනීමට හැකිවේ. ඉන්දියාවේ දිග, ධජාති දම්වැල් වලින් ගවයන් බැඳ තැබීමෙන් කැලයේ ඕනෑවට වඩා දුර යාම වැළැක්වීමට හා සොයා ගැනීමට පහසු කරවා දෙන. මේ සඳහා තෝරා ගත්තා ඇතින්නියන් අභය භූමියේ එක් කොටසක තබාගත හැකි අතර උදේ කාලයේදී ඔවුන්ට සෑහෙන පමණ ජලය සැපයීම අවශ්‍යය. එම ස්ථානය මැවුම් වැනි ජලාශයක් හෝ ගංගාවක් ආශ්‍රිත විය හැකිය. සමහ 3 හෝ 4 පමණ වනයට මුදු හරින සතුන් පසුදු උදැසන යලි පැදුරාගත හැක. සෑම සතකු සවස්ම නිතරම සිටින ඇත්ගොවිවරුන් අවශ්‍ය වන අතර ඔහුට එම සත්වයා කිසිවාරු විටද අහිමිවිය හැක්කේ නැත. එයේ නොවැනි නම් පසුදු සත්වයා ආහාර ගෙන එම ස්ථානයක මිරිකල ඉඳ ඇත.

පැටවුන්ට වයස 3 - 4 පෙන් වැඩිහිටි අන්නද, උපන් වැඩිකර ගැනීමට නම් වයස එකහමාරහමාරේ පිරිදීම තනා කළයුතුය. දකුණු ඉන්දියාවේ බන්ඩිපුර් වැනි යන්ව අභය භූමිවල මෙම ක්‍රමය භාවිතා කරයි. එය අදහස වනුයේ කිරිදෙන වටි සතුන් දෙයට නොපැමිණෙන බැවිනි. ගැබ් කාලය මාස 21 පමණ සහ වයර තුනක ක්ෂීරණ කාලයක් ඇති නිසා ඉක්මනින් ගැබ් නැන්වීමක් සිදු නොවෙරෙණ ප්‍රවේශ්ථා වලදී පැටවකු වයර 5 කට වඩා අඩුකාලයකදී බලාපොරොත්තු විය නොහැක. ඉහත ක්‍රමය යොදු ගැනීමෙදී ඇතින්නියන් සමහරකු ආපසු කැලයට යාමේ ඉඩ ඇතත් එවුන් හැලයේදී පහසුවන නිසා පාඩුවක් ලෙස සැලකිය නොහැක. හිලෑ ඇතින්නන්ගෙන් ලැබෙන පැටවුන් එක්කෙනා කැලෑවලට මුදු හැරීම හෝ පන්සල් ආදියෙහි පෙරහැරවල් සඳහා, ප්‍රාථමික සංවිධාන වලට හෝ ඩෑඩ හැනීම සඳහා විකිණිය හැක. මෙයින් ලැබෙන වදලින් ප්‍රජනක මධ්‍යස්ථාන ගෙන යැඩි කරගත හැකිය.

පින්නවල ඇලි අනාථාශ්‍රයේ ඇති ලප්පක් සිදුව ඇත. මෙහන වයස මාස 5 සිට වයර 22 අතර වයස්වූ අලින් 19ක් යුත් කෘත්‍රිමව හිලෑ කරණලද ඇලි කණ්ඩායමක් විසඟ කරයි. කැලෑවල වටි සතුන් හා පැටවුන්ගෙන් සමන්විත සයදෙනෙක් පමණ ගණනක් සහිත කණ්ඩායම් දක්නට ලැබේ. පහසුන පිරිමි අලි නැතිව වාසය කරයි. පින්නවල සිටින සෑම සතකුම පෙන්වන කරුණ නම්, සවාභාවීය වශයෙන් සංගි සම්පන්න කණ්ඩායමක්, ප්‍රජනනය සිදුවන විට වෙනස් ආකාරයකට සතුන් කල ගැයි හැකි. පෞද්ගලික අලි හිමිකරුවන් තම ඇතින්නියන් ගැබ් ගැන්වීම සඳහා පින්නවලට රැගෙන එමට උනන්දු කල යුතුය.

එකතු බිම ප්‍රමාණයට ජනගහනය වැඩි කිරීම සඳහා නවින සත්ව පාලන ක්‍රම හඳුන්වා දීම යහ පරිසරය දියුණු කිරීම හා සාන්දු ආහාර සහ කොල ආහාර වර්ග පිටින් හඳුන්වා දීම, අවශ්‍යය. ආහාර ප්‍රමාණය වැඩි කිරීමටද ක්‍රමයක් සකස්කල යුතුය. මේ කරුණු මෙන්ම පරිස්සමින් පැටවුන් ඉවත්කර ගෙන ශ්‍රේණිස්ථාපනය කිරීම ප්‍රජනක කටයුතු උද්දිපනයට හේතු වේ. මූලික පහසුකම් සහිතවූ විට කෘත්‍රිම සිංචන ක්‍රම පවා හඳුන්වාදිය හැක.

ආසියානු අලියාගේ අවන්වූ පැවැත්මට සත්ව රක්ෂිත ප්‍රදේශ පමණක් ම නොවේ. වර්තමානයේ ආසියානු අලින් සිටින ප්‍රදේශ ගණනාවකට තිරෙන මධ්‍යස්ථාන මගින් වල් අලින්, අර්ධ හිලෑ අලින් හා හිලෑ අලින් ප්‍රජනනය සඳහා කටයුතු සහජ් කළ යුතුය. මේ කටයුතු නොයාලොන්, ආසියානු අලියා මිලඟ වසර 50 සිට 100 අතර කාලයකදී වඳවීමේ තර්ජනයට ලක්වනු ඇත.

ආවේණික මත්ස්‍යයන්ගේ තත්ත්වය කෙබඳුවේද?

ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයට සාමේක්ෂව එය සතුව ඉතා පොහොසත් මිරිදිය මත්ස්‍ය සම්පතක් ඇත. මේ වන විට වර්ග 65 කටත් වැඩියෙන් හඳුනාගෙන ඇති අතර මින් 1/3 පමණ මෙරට පමණක් වසන (ආවේණික) විශේෂයන්ය. වර්තමානයේදී පරිසරයේ සිදුවන වෙනස්කම්, ඇලදොල, ගංගා ආදියේ සිමාවී වාසය කරන මිරිදිය මත්ස්‍යයන්ට විශාල බලපෑම් ඇතිකර තිබේ.

වනාන්තර සීමාවකින් තොරව එලිකිරීම, කර්මාන්ත ශාලාවලින් පරිසරයට අපද්‍රව්‍ය බැහැර කිරීම, සහ කෘෂි රසායන වල බලපෑම් ආදිය අද, අප හමුවේ ඇති පරිසර ප්‍රශ්නයන් සමහරක්ය. මිරිදිය මත්ස්‍යයන්ට බලපෑම් ඇති කරන තවතෙක් කරුණු නම් අපනයනය සිණිස කරන මසුන් ඇල්ලීම, විඳුවා යෙදීම, වැනි දේ මඟින් විනාශකාරී ලෙස මසුන් මැරීම, අනාව්‍ය සරයෙන් මැණික් ගරන්නන් විසින් සිදුකරන ක්‍රියා, සහ හඳුන්වා දෙන ලද විදේශීය වර්ග වල ක්‍රියාවන්ය. මේ තත්වය යටතේ අපගේ අවධානය යොමුකළ යුතු ආවේණික මත්ස්‍ය විශේෂයන් පිළිබඳව මෙතැන් සිමසා බැලීම වටී.

මල් පුලුවටා (මල් පුලුවටා ක්‍රෙමසෑ) යන මත්ස්‍යයා පමණක් නොව එම විශේෂය අඩංගු ගණයද මෙරටට ආවේණික වීමෙන් විශේෂ වැදගත් කමක් අයත්කර ගනී. කළු පුල්ලි සහිත දුඹුරු පාට ශරීරයක් ඇති, සෙ. මී. 4 ට වඩා නොවැඩෙන මේ මාළුවාට අපවිත්‍ර ජලය වැනි අහිතකර තත්වයන්ට හොඳින් මුහුණදිය හැක. ඔවුන්, වයඹ සහ සබරගමු පලාත්වල ස්ථාන කිහිපයකට සීමා වී පැතිරී ඇත. මෙයින් ජනාකීර්ණ තත්වයක නිමෙන සමතර වයඹ පලාතේ ස්ථාන වල. ගොවිතැනට යොදන කෘෂිරසායන සහ කාර්මික අපද්‍රව්‍ය නිසා මත්ස්‍ය ජනගහනය තුරන්ව ඇත. එහෙත් ඔවුන්ගේ දයහපතට ප්‍රධාන හේතුව වී ඇත්තේ විදේශයන්හි ඔවුන්ට පවතින අධික ඉල්ලුමයි. මෙය සපුරාලීම පිණිස පාලනයකින් තොරව කෙරෙන මසුන් එකතු කිරීම, කලක් නිස්සේ පැවතීමේ ප්‍රතිඵලය වී ඇත්තේ මෙවනවිට ඔවුන් කිසිම තැනකින් සෑහෙන සමණ සොයා ගැනීමට නොහැකි තත්වයක් උදාවී තිබීමය. අද මල් පුලුවටා වඳවියාමේ තර්ජනයට මුහුණ පා ඇත. ඔවුන් රැකගැනීම පිණිස වහාම අවශ්‍ය පියවර ගැනීම අත්‍යාවශ්‍ය කරුණක් ව ඇත.

හල්මල් දණ්ඩියා (රාස්බෝරා වෙටිෆිලෝරිස්) වැඩි වශයෙන් සබරගමුව පලාතෙන් හමුවන කුඩා, අලංකාර රතුපැහැ වර්ගයකි. ඔවුන් ජීවත්වන නොගැඹුරු, සෙමින් ගලන දිය පහරවල් ගණනාවක්ම වනාන්තර එලිකිරීමේ සහ අනවසර මැණික් ගැරීමේ හේතුවෙන් අපවිත්‍ර වීමට හා නිදියාමට ලක්ව ඇත. විශාල ලෙස අපනයනය සඳහා ඇල්ලීම නියා අනෙක් ස්ථාන වලදී මොවුන් දැන් ඉතා විරල තත්වයකට පත්ව ඇත. හැල හැප්පීම් වලට මුහුණදීම අඩු, පහසුවෙන් රෝග වලට පාත්‍ර වන මොවුන්මගෙන් සෑහෙන කොටසක් අපනයනයට පෙරම විනාශ වේ. නුදුරු අනාගතයේදී මෙරටින් තුරන් වීමට හැකි තත්වයකට මුහුණපා සිටින හල්මල් දණ්ඩියාද වහාම රැකගැනීම කලයුතු වේ.

දේශීය ආවේණික වර්ග වලින් ප්‍රසිද්ධම මාළුවා වන බුලත් හපයා ද (බාබුස් නිග්‍රෝපැසියාටස්) අනතුරුදායක තත්වයකට ලඟදීම පත්වන ලකුණු පෙන්නුම් කර තිබේ. මොවුන් බොහෝසේ වසන පෙත් වනාන්තර දැන් සෑහෙන පමණකින් අඩුවී ඇත. 1955 වසරේදී හඳුන්වා දුන් හොඳම වර්ගයාට හිමි සම්මානය ලැබූ බුලත් හපයන්ට ඇති විශාල අපනයන ඉල්ලුම සපුරාලීම සඳහා ගෙරෙන එකතුකිරීම, ඔවුන්ගේ පැවැත්මට හානියක්ව ඇත. ඒ අතර මැණික් ගැරීම හා කෘෂි රසායන වල බලපෑමේ තත්වය නවත් බැඳෙරුම් තත්වයට පත්කිරීමට හේතුවක්ව ඇත.

බුලත් හපයාට සමාන හැඩයෙන් යුතු දිගැටි කළු පුල්ලි දෙකක් සහිත දෙසුල්ලියා (බාබුස් කැට්ලිංගි) කහ වරල් සහිත සහ රතු වරල් සහිත ආකාරයන් දෙකක් තෙත් කලාපයේ විහිදී සිටී. මොවුන් විරල වීමට ප්‍රධාන වූයේද, අපනයනයට ඇල්ලීමයි. එයින්ද වඩාත් ජනප්‍රිය වූයේ රතුවරල් ආකාරයයි. මීට ශක්තියෙන් අඩු දෙසුල්ලියන් ඇල්ලීමේදී සහ ප්‍රවාහනයේදී හැල හැප්පීම් වලින් සෑහෙන සංඛ්‍යාවක් මියයයි. දිය පාරවලට සේදී එන කෘමිනාශකද විනාශය වැඩි කරයි. මොවුන් වඳවී යාමේ තර්ජනයට දැනටමත් පත්වී හෝ නැතිනම් පත්වන්නට ඉතා ආසන්න අවස්ථාවක් මේ වන විට එලඹ ඇත.

ගඩයා (ලැබියෝ fපෂටි) මුහුණපා ඇති ප්‍රශ්නය. මේ සියල්ලටම වඩා වෙනස් ස්වරූපයක එකකි. මහවැලි ගඟේ අතර මැද නොටසේ හා ඒ අවට ඇලදොල වල වෙසෙන අඩියකට වඩා ශ්වල්පයක් විශාල වන. මේ මාළුවාගේ පරිසරය වෙනියෙන් ගලායන දිය පාරවල්ය. මහවැලි ගඟ හැරවීමේ යෝජනා ක්‍රමය නිසා මේ ප්‍රදේශයේ ජලාශ කීපයක් ඉදිවීමෙන් ඔවුන් භාජ්තව සිටින පරිසරයෙන් අතිවිශාල කොටසක් වෙන විට වෙනස් තත්ත්වයකට පත්වෙමින් පැති. මෙම තත්ත්වයට ගඩයා කෙසේ මුහුණ දෙනු ඇත්දැයි තවම නිශ්චය වී නොමැත. යටහට වීට ඔවුන් මේ වෙනස් වූ පරිසරය තුලද ජීවත් වීමට අනුවර්තනය වනු ඇත. ඒ කෙසේ වුවත්. වැඩි ඉඩක් ඇත්තේ ඔවුන්ද නුදුරු අනාගතයේදී ක්‍රමයෙන් දුර්ලභ වී වඳවී යාමේ තර්ජනයකට මුහුණ දීමට ඇති හැකියාවටයි. තවත් කල් නොයවා ආරක්ෂක ජියවර යෙදිය යුතු වර්ගයක් ලෙස ගඩයා හැඳින්විය හැක.

මල් තිත්තයා (බාබුස් නිත්තයා) ජීවත් වන්නේ ඉතා නොගැඹුරු දිය පහරවල් හා දිය තඩිතිවලය. ඔවුන් සිටින ස්ථානවල බැලූ බැල්මට සුලභ බවක් පෙනුනද සංඛ්‍යාව අතින් බලන කල එය එතරම් විශාල නොවේ. පසුගිය දසර කිහිපය තුළ, වර්තවට ඇති වූ වියලී දේශගුණ වලදී මෙවැනි දිය කඩිති රාශියක් වියලී යාම නිසා එසුන් සංඛ්‍යාව සැලකිය පමණකින් පහත බැස ඇත. කෘමි රසායන නිසා සහ එසුන් එකතු කිරීමද, එම තත්ත්වය වැඩිකර ඇත. උභය වර්ගයද, තව ටික කලක් යාමේදී වඳවීමේ තර්ජනයට මුහුණ පෑමේ ලකුණු පෙන්නුම කර ඇත.

පුළුටියා (කෙලෝන්ටියා සිංහාතා) පහතරට ප්‍රදේශ රාශියකම වාසය කරන, අපිරිසිදු ජලයෙහිද ජීවත්වීමේ හැකියාව දරණ අහල් ෆන් පමණ දිගට වැඩෙන වර්ගයකි. මැණික් ගැරීමෙන් අපිරිසිදු වූ ස්ථාන වල සහ නොකැඩි සිටිනු දක්නට හැක. නමුත් කෘමි රසායන වල බලපෑම නිසා මොවුන් මේ වන විට රසායන ද්‍රව්‍ය යොදා ගොවිතැන් කරන සමහර ප්‍රදේශවල ඇල දොල වලින් තුරන්ව ඇත. තවත් පලාත්වල විශේෂයෙන්ම සියලි කලාපයේ මෙරටට හඳුන්වා දෙන ලද මත්ස්‍යයකු වන තිලාපියාගෙන් ඵල්ල වන තරඟය ඉදිරියේ සංඛ්‍යාවෙන් අඩුවී යාම පෙන්වයි. අනෙයන කරුණුත් එකිනෙ කිරීමද සැහෙන පමණ ඔදුවේ කලුවැල් සහ කුකුලැමුවන් ගෙඩි යොදා කරන විෂකර මෘදු ඇල්ලීමද පළුවාට ඉතා අහිතකර බලපෑම් සිදුකරයි. විෂ බලපෑමෙන් ඉහලට මතුවන වැසුනු පුළුටින් ආහාර ලෙස ඉවත් කරන අතර, පැටවුන් සමහරවිට මියයාම හා අනෙකුත් යතුනප පහසුවෙන් ගොදුරු වීම සිදුවේ. කලකට පෙර සුලභව සිටි මේ වර්ගය අද හංගාහාවෙන් සැහෙන පමණ අඩුවෙමින් පවතින බව පැහැදිලිය.

සරත් ගුණවර්ධන විසිනි.

With Best Compliments

from

LANKA TRADERS

DEALER IN TEXTILES

ASLAM TRADE CENTRE
188/2 J, Keyzer Street
COLOMBO-11

With Best Compliments

from

EVERLAST ALUMINUM WORKS

131, Stanley Tilakaratne Mawatha
NUGEGODA Tel :- 553300

Manufacturers of
Aluminium Doors, Windows, Shop fittings,
Partitions and Curtainwall Systems.

With Best Compliments
from

All Kind of Timber Merchant

SUBASINGHE & COMPANY
23, Nawala Road
NUGEGODA

Tel:- 553152

We undertake the Repairs of
all type of
TIME PIECES
including
ELECTRONIC & WALL CLOCKS

MOULANA WATCH REPAIRS

192, Maulana Building
2nd Cross Street
Pettah
COLOMBO-11

ඔබ මේ ගැනත් සිතුවාද ?

ඇමරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියා ප්‍රාන්තයේ උරග විද්‍යා පරීක්ෂණාගාරයේ ටිවඩ් ජී. රෝස් මහතාගේ ලිපියක් ඇසුරෙන් ජාතික සත්ත්වෝද්‍යානයේ සත්ව ආරක්ෂක (උරග) නිලධාරී මොල්ලිගොඩ මහතා විසින් සකස් කරන ලදී.

උරගයන් පිළිබඳ හදාරන බොහෝදෙනා උරග සතුන් ඇති කිරීමට බොහෝවිට පෙළඹෙන බව දක්නට ලැබේ. මෙම සතුන් ප්‍රහසුවෙන් ස්වභාවිකව නිරීක්ෂණය කිරීම අපහසු නියා මෙසේ කිරීම කරුණු ලැබුවද එන සත්ව හා වෘක්ෂ ආරක්ෂක පනත යටතේ එසේ කිරීම වරදක් වවද, නීතිමය කඩ කිරීමක් වුවද උරගයන් ඇති කිරීම එම සතුන්ට ශාරීරික හා මානසික පීඩා ගෙන දෙන්නක් බව බොහෝ දෙනා අමතක කරති.

නොදියුණු සත්ව ශෝටසක් යැයි හඳුන්වනු ලබන මොලුන් ඇති කිරීමේදී විය හැකි අපහසුකම් ආදිය මත දැනිවන ශාරීරික හා මානසික තත්වයන් හෙන් ඔවුන් ප්‍රහසුවෙන් මරණය කරා ලඟා කරවයි. වෙවැනි අවස්ථා කීපයක් පිළිබඳව අප අවධානය යොමු කරමු.

- ඇති කරන උරගයන් ඩැහැයක දමා ප්‍රසැලකට හෝ දර්ශණයක් සඳහා හෝ මහජන ප්‍රදර්ශණයක් සඳහා ගෙන ගොස් අතින් අත මාරුකර නැවත සත්වයා සිටින පෙට්ටියට ගෙනවිත් දැමීම කරනු ලැබේ. මෙම සත්වයා ක්ෂනික උෂ්ණත්ව වෙනසකට, ලක්වීම හා ක්ෂණික පරිසර වෙනස්වීම් ආදිය නිසා රෝගී වී මිය යා හැක. (සමහර සත්වයින් මෙම තත්වයන්ට ගාර්ථක ලෙස මුහුණ දෙනු දැකිය හැක.)

- එක් අවස්ථාවක සතුන් ඇති කරන ස්ථානයක බෝකිරීම සඳහා ගැහැනු සතෙකු හා පිරිමි සතුන් දෙදෙනකු දමා තිබිණි. මෙම පිරිමි සතුන්ගෙන් එක් සතෙකු අනිකාට වඩා ප්‍රමාණයෙන් විශාලය. සතියකට පමණ පසු කුඩා පිරිමි සතා දරුණු රෝගී තත්වයක් පෙන්නුම් කර දැන. මෙහිදී සිදුව ඇත්තේ කුඩා ඉඩක් ඇති එම කුඩුව තුල. විශාල පිරිමි සතාව රෝගී තත්වයට පත්වූනු කුඩා සතා විසින් මග ඇරීමට උත්සාහ කලද එසේ කිරීමට නොහැකි වීම නිසා ඒ නුලින් ඇතිවන මානසික පීඩාව මෙම සත්වයා රෝගී කිරීමට හේතුවයි.

